සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## 11 ශ්‍රේණිය - අනාවරණ පරීක්ෂණය 2020

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

**නම/අංකය :** ................................................................ **කාලය : පැය 01 යි.**

(A) කොටස (බහුවරණ)

උපදෙස් :-
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පසු පස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදන්න.

---

01. සන්නිවේදනයෙන් සිදු කරනු ලබන වැදගත්ම මෙහෙවර,
    (1) පුළුල් ප්‍රජාවක් වෙත තොරතුරු ගෙන යාම ය.
    (2) අදහස් පොදු බවට පත් කිරීම ය.
    (3) විනෝදය හා අධ්‍යාපනය ලබාදීම ය.
    (4) ප්‍රජාව අතර අන්තර් සම්බන්ධතා ගොඩනැගීම ය.

02. ගුවන් විදුලි නිවේදකයකු සතු විය යුතු ගුණාංග දැක්වෙන පිළිතුර තෝරන්න.
    (1) මනා හඬ පාලනය - වේගවත් කථාව - උපහාසය දැනවීමේ හැකියාව.
    (2) චතුර කථිකත්වය - මිශ්‍ර බස භාවිතය - විනෝදය ඉස්මතු කිරීමේ හැකියාව.
    (3) වේගවත් කථාව - පුළුල් වාග් කෝෂයක් තිබීම - ප්‍රාමාණික විෂය දැනුමේ හැකියාව.
    (4) පුළුල් වාග් කෝෂය - මනා හඬ පාලනය තිබීම - ප්‍රාමාණික විෂය දැනුම.

03. අවිධිමත් සන්නිවේදනය සඳහා මානවයා පෙළඹුනේ,
    (1) සමාජ පාලනයේ ප්‍රබල හැකියාවක් ඊට තිබීම නිසාය.
    (2) නීතිය පිළිපැදීමට ඇති අකමැත්ත නිසාය.
    (3) හාස්‍ය උත්පාදනයට ඇති ආශාව නිසාය.
    (4) තොරතුරුවල විශ්වසනීයත්වය හොඳින් රැකෙන නිසාය.

04. මිල්ටන් බ්‍රෂ්ට අනුව ''සෑම උද්වේගකර ආරංචියක්ම ප්‍රවෘත්තියකි.'' මෙම ප්‍රකාශයෙන් ගම්‍ය වනුයේ,
    (1) ප්‍රවෘත්ති යන්න සිද්ධි දාමයන්ට පමණක් සීමා වන බවය.
    (2) ප්‍රවෘත්ති හඳුනා ගැනීමට වැදගත් වන බවය.
    (3) ප්‍රවෘත්ති යනු විශේෂිත සිදුවීමක් වන බවය.
    (4) ඕනෑම ආරංචියක් ප්‍රවෘත්තියක් වන බවය.

05. ගුටෙන්බර්ග් මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීමෙන් පසු එළඹුන යුගය තුළ ඇති වූ වැදගත්ම වෙනස වන්නේ,

(1) පොත්පත් විශාල වශයෙන් බිහිවීම යි.

(2) දැනුම - සමාජයේ සියලු ස්ථර කරා පැතිරීම යි.

(3) උත්තල මුද්‍රණ ක්‍රමය භාවිතයට ගැනීම යි.

(4) ලේඛකයන් විවිධ පොත් ලිවීම ඇරඹීම යි.

06. නිශ්චල ඡායාරූප කැමරාවක,

(a) - ද්වාරය, සේයා පටලයට ලැබෙන ආලෝක ප්‍රමාණය පාලනය කරයි.

(b) - විවරය, සේයා පටලයට ලැබෙන ආලෝක ප්‍රමාණය පාලනය කරයි.

(c) - විවරය, ඡායාරූපයේ ක්ෂේත්‍ර ගැඹුර පාලනය කරයි.

(d) - ද්වාරය, දර්ශනයේ චලනය පාලනය කරයි.

මේ අතුරින්,

(1) a හා b පමණක් නිවැරදිය. (2) a හා c පමණක් නිවැරදිය.

(3) b හා c පමණක් නිවැරදිය. (4) සියලු ප්‍රකාශ සත්‍ය වේ.

07. සන්නිවේදන ක්‍රියාවලිය ද්විමාර්ගික වීමට නම්,

(1) නාලිකාව මැනවින් ක්‍රියාත්මක වීම අවශ්‍ය වේ.

(2) බාධක මැනවින් ක්‍රියාත්මක වීම අවශ්‍ය වේ.

(3) සන්දේශ සරලවීම අනිවාර්ය්‍ය වේ.

(4) ප්‍රතිපෝෂණය අන්තර්ගත වීම අනිවාර්ය්‍ය වේ.

08. ජනමාධ්‍ය ආයතනයක ප්‍රතිපත්ති සකස් කරනු ලබන්නේ,

(1) ග්‍රාහකයන් ය. (2) ජනමාධ්‍යවේදීන් ය.

(3) දැන්වීම්කරුවන් ය. (4) හිමිකරුවන් ය.

09. රූපවාහිනිය නරඹනවාට වඩා ගුවන් විදුලිය ශ්‍රවණය කිරීමෙන් අමතර වාසි බොහෝමයක් ලැබේ. එසේ ලැබිය හැකි ප්‍රධාන වාසියක් වන්නේ.

(1) පරිකල්පනය සඳහා වැඩි ඉඩක් ලැබීම. (2) ග්‍රාහකත්වයට අවම මුදලක් වැය වීම.

(3) වැඩසටහන් වැඩි ප්‍රමාණයක් ශ්‍රවණය කිරීම. (4) සරල තාක්ෂණයක් අනුගමනය කිරීම.

10. දේශනයකට සවන්දීමේදී හොඳ ශ්‍රාවකවකුට නොගැළපෙන ක්‍රියාව වන්නේ,

(1) ප්‍රශ්න ඇසීමට ක්‍රියා කිරීම යි.

(2) සිත එක අරමුණකින් තබාගෙන සවන්දීම යි.

(3) නිගමන වලට එළඹීම අත්හිටුවීම යි.

(4) දේශකයාගේ පෙනුම ගැන අවධානය යොමු කිරීම යි.

11. නිල ලිපි ශීර්ෂයක් සහිත ලිපියක් ඒ ආකාරයෙන්ම ඉක්මනින් හා පහසුවෙන් තවත් ස්ථානයක් වෙත යැවිය හැකි වන්නේ,

(1) විද්‍යුත් තැපෑල මගිනි. (2) ෆැක්ස් යන්ත්‍රය මගිනි.

(3) ඩිජිටල් කැමරාවක් මගිනි. (4) ඡායා පිටපත් යන්ත්‍රයක් මගිනි.

12. දක්ෂ ජනමාධ්‍යවේදියෙකුට,

(A)- කාලීන සිදුවීම් පිළිබඳ මනා වැටහීමක් තිබිය යුතුය.

(B)- යමක් විශ්ලේෂණය කළ හැකි විය යුතුය.

(C) - නිරවද්‍යතාවය පිළිබඳ උනන්දුවක් තිබිය යුතුය.

ඉහත ප්‍රකාශ වලින්,

(1) A පමණක් නිවැරදි වේ. (2) A හා B පමණක් නිවැරදි වේ.

(3) A හා C පමණක් නිවැරදි වේ. (4) A, B හා C යන සියල්ල නිවැරදි වේ.

13. ග්‍රාහක ක්ෂේත්‍රය වෙත සම්ප්‍රේෂණය කරනු ලබන පණිවිඩය පිළිබඳ පාලනයක් සිදු කළ හැකි පුද්ගල කණ්ඩායමක් වන්නේ,

(1) නිසි බලධාරීන් ය. (2) දොරටු පාලකයින් ය.

(3) නියාමකයින් ය. (4) සංස්කාරකයින් ය.

14. භාෂාවේ කාර්යයන් පිළිබඳ 11 ශ්‍රේණියේ සිසුන් තිදෙනෙකු අතර වූ සංවාදයක් මෙසේය.

උපාලි :- කාලය සන්නිවේදනයට භාෂාව තරම් වැදගත් උපකරණයක් තවත් නැති නිසා භාෂාවෙන් වන වැදගත්ම කාර්යය මෙය වේ.

කුමාරි :- මානවයාගේ පැවැත්ම සහතික කර ඉදිරිගාමීව පවත්වාගෙන යාම ද භාෂාවේ කාර්යයක් වේ.

නෙතුලි :- දැනුම ප්‍රවේශනයට පමණක් දායක වන භාෂාව දැනුම සංරක්ෂණයට කිසිදු කාර්යයක් සිදු නොකරයි.

පිළිගත හැකි ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ,

(1) උපාලි හා කුමාරි පමණි. (2) කුමාරි හා නෙතුලි පමණි.

(3) උපාලි හා නෙතුලි පමණි. (4) උපාලි, කුමාරි හා නෙතුලි පමණි.

15. සිසුන් පිරිසක් වනගත චාරිකාවක යෙදුනු අතර, එහිදී 1/2 km ඈතින් වූ පෙදෙසක භූමියේ සැරිසරන ව්‍යාඝ්‍රයකු දුටුවේය. මෙම සත්වයාගේ ඡායාරූපයක් ගැනීමට සිසුන් භාවිත කළ යුතු කාච වර්ගය වන්නේ,

(1) සාමාන්‍ය කාචයයි. (2) පුළුල්කෝණ කාචයයි.

(3) පටු කෝණ කාචයයි. (4) යුහුඹු කාචයයි.

16. නිර්වාචික සන්නිවේදනය ඉතා ප්‍රබල ලෙස හා කලාත්මක ලෙස භාවිත කළ හැකි ජනමාධ්‍ය විශේෂයකි.

(1) බලි තොවිල් - ශාන්තිකර්මය. (2) මුහුණුපොත - YouTube ය.

(3) පුවත්පත - පොත් (4) රූපවාහිනිය - සිනමාව.

17. සන්නිවේදන ක්‍රියාවලියක දී ප්‍රතිපෝෂණය වැදගත් වන්නේ
   (1) අසාර්ථක සන්නිවේදන ක්‍රියාවලීන් නවතා දැමීමටයි.
   (2) සන්නිවේදන උපකරණ දෝෂ හඳුනා ගැනීමටයි.
   (3) සන්නිවේදන ක්‍රියාවලිය අලුතින් ආරම්භ කිරීමටයි.
   (4) විකල්ප සන්නිවේදන ක්‍රම වලට යොමු වීමටයි.

18. ප්‍රවෘත්තියක ඇතුලත් විය යුතු ගුණාංග අතරට අතවශ්‍ය **නොවන** ගුණාංගය,
   (1) සත්‍ය හා නිවැරදි බවය. (2) නිරවුල් බවය.
   (3) සමතුලිත බවය. (4) සංක්ෂිප්ත බවය.

19. තොරතුරු හුවමාරු කිරීමේ උපකරණ අඩංගු වරණය වන්නේ.
   (1) අන්තර් ක්‍රියාකාරී පුවරුව, දුරකථනය, ෆැක්ස් යන්ත්‍රය,
   (2) ෆැක්ස් යන්ත්‍රය, ජංගම දුරකථනය, පේජරය
   (3) විද්‍යුත් තැපෑල, වෙබ් අඩවි, විද්‍යුත් පිරික්සුම් උපකරණ.
   (4) CCTV කැමරා, අන්තර්ජාලය, විද්‍යුත් පිරික්සුම් උපකරණ.

20. හැරල්ඩ් D ලැස්වෙල්ට අනුව සන්නිවේදන ක්‍රියාවලියේ ප්‍රධාන අංග පහ වනුයේ,
   (1) සන්නිවේදකයා - නාලිය - සංදේශය - ග්‍රාහකයා - ප්‍රතිචාරය.
   (2) සන්නිවේදකයා - ආකේතකරය - නාලිය - විකේතකරය - ප්‍රතිචාරය.
   (3) මූලාශ්‍රය - සංදේශ - ශ්‍රාවකයා - සන්දර්භය.
   (4) සන්නිවේදකයා - සංදේශය - නාලිය - ග්‍රාහකයා - බලපෑමය.

21. අන්තර් පුද්ගල සන්නිවේදනය බොහෝ විට,
   (1) ශ්‍රව්‍ය හා කථන සන්නිවේදන එකතුවකි.
   (2) වාචික හා නිර්වාචික සන්නිවේදන එකතුවකි.
   (3) දෘශ්‍ය හා වාචික සන්නිවේදන එකතුවකි.
   (4) විධිමත් හා අවිධිමත් සන්නිවේදන එකතුවකි.

22. විධිමත් සන්නිවේදන ආකෘති දෙකක් ලෙස ''දාම ආකෘතිය'' හා ''රෝද ආකෘතිය'' දැක්විය හැක. මෙයින් රෝද ආකෘතිය දාම ආකෘතියට වඩා වෙනස් වන්නේ,
   (1) එක් අයෙකුගෙන් අනෙක් අයෙකුට තොරතුරු ලැබෙන නිසාය.
   (2) පළමු තොරතුරු සන්නිවේදකයාට නොලැබෙන නිසාය.
   (3) එක් අයෙක් කේන්ද්‍ර කරගෙන අනෙක් අයට තොරතුරු ලැබෙන නිසාය.
   (4) දෙතුන් දෙනෙක් මගින් සෙසු අයට තොරතුරු ලැබෙන නිසාය.

23. සංවෘත රූපවාහිනී ජාලයකින් ලැබිය හැකි වැදගත්ම සේවය වන්නේ,
   (1) ආයතනයක් තුළ කාර්ය මණ්ඩලයට තොරතුරු බෙදා හැරීම යි.
   (2) කුඩා ප්‍රදේශයක් ආවරණය කරමින් වැඩසටහන් විසුරුවා හැරීම යි.
   (3) ආයතන කළමනාකරණයට අවශ්‍ය නිරීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම යි.
   (4) ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සඳහා රූප මාධ්‍ය භාවිත කිරීමේ හැකියාව යි.

24. ප්‍රවෘත්තියක ගුණාත්මක බව මැන ගැනීම සඳහා පාදක කරගනු ලබන A + B + C = C යන්නෙහි A හා B අක්ෂර වලින් නිරූපණය වන්නේ,

(1) නිශ්චිත බව - සමබර බව. (2) නිශ්චිත බව - කඩිනම් බව.

(3) නිවැරදි බව - සමතුලිත බව. (4) නැවුම් බව - නිරවුල් බව.

25. දේශකයකු විසින් කලින් සකස්කරගත් පින්තූර ග්‍රාහකයා හට නැවත නැවත ප්‍රදර්ශනය කිරීමට භාවිත කළ හැකි ප්‍රක්ෂේපණය නොවන මාධ්‍ය උපකරණය වන්නේ,

(1) කළු ලෑල්ල (2) සුදු ලෑල්ල

(3) පිටු පෙරළනය (4) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය

26. ආයතන ප්‍රධානියා නිකුත් කළ නිවාඩු සීමා කිරීමේ දැන්වීමේ භාෂා සංකේත තේරුම් ගැනීමට සේවකයන්ට නොහැකි විය. මෙම තත්ත්වය හොඳින් විග්‍රහ කළ හැක්කේ,

(1) ලැස්වෙල් ආකෘතියෙනි.

(2) ද්‍රාම ආකෘතියෙනි.

(3) ද්වී මාර්ගික ආකෘතියෙනි.

(4) ෂැනොන් - වීවර් ආකෘතියෙනි.

27. පුවත්පතක් සඳහා ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී වැදගත්ම තොරතුරු මුලින්ම ඉදිරිපත් කරයි. මෙම රචනා ක්‍රමය,

(1) උඩුකුරු පිරමීඩ න්‍යාය නම් වේ.

(2) මූල පාඨ රචනය නම් වේ.

(3) දෘඪ පුවත් වාර්තාකරණය නම් වේ.

(4) ගවේෂණාත්මක වාර්තාකරණය නම් වේ.

28. ලේඛනයේ විකාශනය පිළිබඳ අධ්‍යයනයක යෙදෙන සා.පෙළ සිසුවෙකුට මධ්‍යතන යුගයේ දී හමු වන ලේඛන ස්වරූපය වීමට ඉඩ ඇත්තේ,

(1) උත්තල මුද්‍රණ ශිල්පීය තාක්ෂණය යොදා ගැනීමයි.

(2) සමතල මුද්‍රණ ශිල්පීය තාක්ෂණය යොදා ගැනීමයි.

(3) රූපාක්ෂර අක්ෂර මාලා තාක්ෂණය යොදා ගැනීමයි.

(4) ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය යොදා ගැනීමයි.

29. පුවත්පත් ආයතනික ව්‍යුහයක පවතින ප්‍රධාන අංශ විය හැක්කේ,

(1) පාලන අංශය - දැන්වීම් අංශය - කර්තෘ මණ්ඩලය.

(2) කර්තෘ මණ්ඩලය - ලේඛක මණ්ඩලය - මුද්‍රණ අංශය.

(3) අධ්‍යක්ෂක මණ්ඩලය - කර්තෘ මණ්ඩලය - දැන්වීම් අංශය.

(4) දැන්වීම් අංශය - පිටු සැකසුම් අංශය - සෝදුපත් අංශය.

30. නිශ්චල ඡායාරූප ගන්නා කැමරාවක අත්‍යවශ්‍ය මූලිකාංග පහත පරිදිය.

(1) කාච විවරය - මානනය - කැමරා ද්වාර වේගය - සුදුසු පටලය තෝරාගැනීමයි.

(2) ආලෝක ලාම්පුව - මානනය - නාභිගත කිරීම - පිරි සැකසුම් කිරීමයි.

(3) කාච විවරය - ආලෝක ලාම්පුව - කැමරා ද්වාර වේගය - සුදුසු පටලය යෙදීමයි.

(4) ආලෝක ලාම්පුව - කාච විවරය - කැමරා ද්වාර වේගය - සුදුසු පටලය තෝරා ගැනීමයි.

31. එක්තරා පුවත්පතක සාහිත්‍යමය තොරතුරු වාර්තා කිරීම සඳහා"සාහිත්‍ය පිටුව" නමින් වෙනම ම පිටුවක් වෙන්කර ඇත. එම පිටුව අයත්වන්නේ පුවත් පතේ කවර අංශයට ද?

(1) ප්‍රවෘත්ති අංශය (2) දැන්වීම් අංශය

(3) විශේෂාංග අංශය (4) සංස්කරණ අංශය

32. පුද්ගලයාගේ චර්යාවට බලපාන පාරිසරික සාධක හෙළිදරව් කිරීම සඳහා රූපවාහිනී නාට්‍ය අධ්‍යක්ෂවරයා යොදා ගත යුත්තේ,

(1) සමීප රූපය. (2) දුර රූපය.

(3) මධ්‍ය රූපය. (4) ද්විත්ව රූපය.

33. සන්නිවේදන ක්‍රියාවලිය පවත්වා ගෙන යාම සඳහා ප්‍රධාන වශයෙන් අවශ්‍ය වන්නේ,

(1) සන්නිවේදකයා ය. (2) ග්‍රාහකයා ය.

(3) බලපෑම ය. (4) පණිවිඩය ය.

34. පුවත්පත් ආයතනයක් පළ කරනු ලබන සියලුම පුවත්පත්වල සංස්කාරක වගකීම් පිළිබඳ එක් පුද්ගලයෙකුට පවරන ලද අවස්ථාවක ඔහු හඳුන්වනු ලබන්නේ,

(1) ප්‍රධාන කර්තෘ වශයෙනි. (2) කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂක වශයෙනි.

(3) සහාය කර්තෘ සංස්කාරක වශයෙනි. (4) අධ්‍යක්ෂ ජනරාල් වශයෙනි.

35. කුමාර සමග ඔලිම්පික් තරගය නරඹමින් සිටි සමන් ඔහු සමග හුසේන් බෝල්ට් ගැන කතා බහක නියැලුනේය. මෙහිදී සමන්,

(1) සන්නිවේදකයෙක් පමණි.

(2) කුමාර සන්නිවේදකයෙක් පමණි.

(3) සමන් (S→R) භූමිකා හුවමාරු කරගනී.

(4) කුමාර හා සමන් (S→R) භූමිකා හුවමාරු කරගනී.

36. ජනමාධ්‍ය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) මාධ්‍යවල තනි හිමිකාරිත්වය මාධ්‍ය ඒකාධිකාරීත්වයක් නිර්මාණය කරයි.

(2) සන්දේශ සෑමවිටම ඉහළ සිට පහළට විසුරුවා හැරෙනු ඇත.

(3) මැතිවරණ දේශපාලනය තවමත් ප්‍රවෘත්ති අතර ප්‍රධාන තැනක් ගනියි.

(4) ග්‍රාහකයන්ගේ සක්‍රීය සහභාගීත්වයක් දක්නට ලැබෙනු ඇත.

37. පුවත්පතක හාස්‍ය, උපහාස රසය මෙන්ම සමාජීය වශයෙන් වැදගත් වූ තොරතුරු සන්නිවේදනයට දෘශ්‍යමය ස්වරූපයෙන් පමණක් යොදා ගන්නා පුවත් අන්තර්ගතය.

| | |
|---|---|
| (1) ප්‍රවෘත්ති නම් වේ. | (2) සංස්කාරක වැකිය නම් වේ. |
| (3) තිරු ලිපිය නම් වේ. | (4) කාටූන් නම් වේ. |

38. උසස් ජන සන්නිවේදන ක්‍රියාකාරීත්වයෙන් යුක්තව **ලංකාවේ** පළ වන පුවත්පත් විශේෂයකි.

(1) බ්‍රෝඩ්ෂීට් පුවත්පත්‍ය.

(2) බර්ලීනර් පුවත්පත්‍ය.

(3) ටැබ්ලොයිඩ් පුවත්පත්‍ය.

(4) කොම්පැක්ට් පුවත්පත්‍ය.

39. වක්‍ර වෙළඳ ප්‍රචාරණ සම්බන්ධයෙන් පිළිගත **නොහැකි** වගන්තිය තෝරන්න.

(1) වැඩසටහනට බාධාවක් නොවන පරිදි විකාශනය වන්නකි.

(2) නිවේදක ක්‍රියාව අනිවාර්යයෙන්ම අවශ්‍ය වන්නකි.

(3) දිගු වේලාවක් ග්‍රාහකයාට ප්‍රදර්ශනය කළ හැකි මාධ්‍යයකි.

(4) අවම පිරිවැයක් දැරිය යුතු මාධ්‍ය විශේෂයකි.

40. එක්තරා සන්නිවේදන වර්ගයක් පිළිබඳ සිසුන් තුන්දෙනෙක් දැක්වූ අදහස් පහත දැක්වේ.

A - එය කුළුපග මෙන්ම සෘජුය.

B - සන්නිවේදක ග්‍රාහක භූමිකා හුවමාරු වේ.

C - එසැනින් ප්‍රතිපෝෂණය සිදු වේ.

ඉහත දැක්වෙන අදහස් වලට සමීප සන්නිවේදන වර්ගය වන්නේ.

(1) කණ්ඩායම් සන්නිවේදනය.

(2) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය

(3) ජන සන්නිවේදනය.

(4) අන්තර් පුද්ගල සන්නිවේදනය

(ලකුණු. 1 x 40 = 40)

---

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## 11 ශ්‍රේණිය - අනාවරණ පරීක්ෂණය 2020

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

**නම/අංකය :** ............................................................... **කාලය : පැය 02 යි.**

සැලකුය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- පළමු වන ප්‍රශ්නයට ලකුණු 20 හිමි වන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.

---

01. කෙටි පිළිතුරු සපයන්න.

විද්‍යාලයේ බිත්ති පුවත්පත සඳහා මාධ්‍ය ඒකකය මගින් නිර්මාණ භාරගැනීම සිදුකරන ලදී. එහිදී විද්‍යාලයේ බොහෝ සිසුන් ලියන ලද ලේඛන මාධ්‍ය ඒකකයට භාරදී තිබුණි.

(1) සිසුන් ලියන ලද ලේඛන අයත් වන සන්නිවේදන **ස්වරූපය** කුමක්ද?

(2) වාචික භාෂාවට වඩා ලිඛිත භාෂාව විධිමත් වන ආකාරය කරුණු දෙකක් මගින් දක්වන්න.

(3) **ඵලදායී ලේඛනයක** දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න.

(4) සිසුන්ගේ නිර්මාණ පරිගණකය මගින් මුද්‍රණය කිරීමට යෝජනා විය. පරිගණකය ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ පියවර හතර නම් කරන්න.

(5) සිසුන්ගේ නිර්මාණ කීපයක් පුවත්පතේ පළ කිරීමට කටයුතු යොදන ලදී. එහි දී දොරටුපාල ක්‍රියාවලිය මත ලිපි වල සිදුවිය හැකි වෙනස්කම් දෙකක් ලියන්න.

(6) බිත්ති පුවත්පත පිළිබඳ තොරතුරු ගලා යා හැකි **අවිධිමත් සන්නිවේදන** දාම හතරක් නම් කරන්න.

(7) ලිපි ලිවීමට පෙර සිසුන් තොරතුරු රැස් කිරීම සඳහා යොදාගත් ශිල්ප ක්‍රම හතරක් නම් කරන්න.

(8) සිසු නිර්මාණ පසුව විද්‍යුත් පුවත්පතකට යොමු කරන ලදී. විද්‍යුත් පුවත්පතක දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න.

(9) පුවත්පත් නිර්මාණයේ මූලික පියවර හතරක් නම් කරන්න.

(10) පුවත්පත් ආයතනයක ප්‍රධාන කතෘ සතු කාර්යභාරයන් දෙකක් ලියන්න.

(ලකුණු. 2 x 10 = 20)

02. ''ප්‍රවෘත්ති යනු ජනතාවට බලපාන්නා වූත්, ඔවුන් තුළ උනන්දුවක් ඇති කරන්නා වූත්, මෑත කාලීන වැදගත් සිදුවීමකට අදාළ අලුත් තොරතුරකි.''

(1) ඉහත ප්‍රකාශය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින්ද? ලකුණු 01

(2) ප්‍රවෘත්තියක අන්තර්ගතය හා ස්වභාවය අනුව ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රභේද කෙටියෙන් පැහැදිලි කරන්න. ලකුණු 02

(3) කිසියම් සිද්ධියක ප්‍රවෘත්තිමය වටිනාකම තීරණය කිරීමෙහිලා බලපාන සාධක තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. ලකුණු 03

(4) තොරතුරු රැස් කිරීම සඳහා යොදාගන්නා මූලාශ්‍ර හතරක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. ලකුණු 04

03. මානව සන්නිවේදනයේ මූලික අවශ්‍යතා පමණක් නොව සංකීර්ණ සමාජ අවශ්‍යතා ඉටුකර ගැනීමට ලේඛනය ඉතා වැදගත් වේ.

(1) පුරාතන යුගයේ ලේඛනය සඳහා භාවිත කළ විවිධ ශාක පත්‍ර වර්ග දෙකක් නම් කරන්න. ලකුණු 01

(2) මුද්‍රණ ශිල්පය ආරම්භ වීමට බලපෑ හේතු සාධක දෙකක් නම් කරන්න. ලකුණු 02

(3) මාධ්‍ය මගින් ඉදිරිපත් වන තොරතුරුවල විවිධ ගුණාංග ගැබ්වී තිබීමට බලපාන සාධක තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. ලකුණු 03

(4) මුද්‍රිත පුවත්පතේ නවතම ප්‍රවණතාවය වන විද්‍යුත් පුවත්පත්වල (e-News Paper) දක්නට ලැබෙන පොදු ලක්ෂණ හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න. ලකුණු 04

04. ''තොරතුරු, දැනුම, අදහස් ආදිය හුවමාරු කරගැනීම සන්නිවේදනයයි.''

(1) සන්නිවේදනයේ මූලික කාර්යන් හතරක් නම් කරන්න. ලකුණු 01

(2) අන්තර්පුද්ගල සන්නිවේදනයේ මූලික අවස්ථාවක් වන ද්විපුද්ගල සන්නිවේදනයේ අවශ්‍යතාව කරුණු හතරක් යටතේ දක්වන්න. ලකුණු 02

(3) සමූහ සන්නිවේදනය ඈත අතීතයේ සිටම භාවිත කළ ප්‍රබල සන්නිවේදන ක්‍රමයකි. සමූහ සන්නිවේදනයේ විශේෂතා තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. ලකුණු 03

(4) ''ජන සන්නිවේදනය නූතන සමාජයේ පැවැත්මට දැඩි ලෙස බලපෑම් ඇති කරයි.'' යන තේමාව යටතේ කරුණු හතරක් පදනම් කරගෙන විශේෂාංග ලිපියක් ලියන්න. ලකුණු 04

05. 1. නිශ්චල ඡායාරූප භාවිතය නිසා මුද්‍රිත මාධ්‍යට ලැබෙන වාසි දෙකක් නම් කරන්න. ලකුණු 01

2. කිසියම් ආයතනයකට වෙබ් අඩවියක් පවත්වාගෙන යාමෙන් අත්වන වාසි හතරක් නම් කරන්න. ලකුණු 02

3. භාෂාවේ මූලික කාර්යයන් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. ලකුණු 03

4. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලිය වර්තමාන සමාජය තුළ අත්‍යවශ්‍ය කාර්යයක් බවට පත්වී ඇත. ඔබ මෙම ප්‍රකාශය හා එකඟ වන්නේද? කරුණු හතරක් යටතේ පැහැදිලි කරන්න. ලකුණු 04